598

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
කළමනාකරණ අධ්‍යයන ගෞරව උපාධි වැඩ සටහන - 3 වන මට්ටම
අධ්‍යයන වර්ෂය :2022/23
OSU3501 - කළමනාකරණ න්‍යාය සහ පරිවය
පැවරුම් පරීක්ෂණය
කාලය - පැය දෙක (02)යි.

විභාග අංකය - ----------

දිනය - 2023.02.12 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. පළමු කොටස බහුවරණ ප්‍රශ්නවලින් සහ දෙවන කොටස රචනාමය ප්‍රශ්නවලින් යුක්ත වේ.

පළමු කොටස සඳහා උපදෙස් :

- පළමු කොටස බහුවරණ ප්‍රශ්න 25 කින් සමන්විත වන අතර එයට ලකුණු 50 ක් හිමිවේ .
- සියලුම ප්‍රශ්න සඳහා මෙම **ප්‍රශ්න පත්‍රය තුළම වඩාත් සුදුසු සිළිතුර යටින් ඉරක් අඳින්න.**
- ඔබගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ කොටුවේ සඳහන් කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ පළමු කොටස පිළිතුරු සැපයීමට ලබාදී ඇති පොතට අමුණන්න.

1 වන කොටස

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් විද්‍යාත්මක කළමනාකරණයේ (Scientific Management) පුරෝගාමීන් නිවැරදිව දක්වා ඇති ප්‍රකාශ (ය) කුමක් ද?

A. එෆ්.ඩබ්ලිව්. ටේලර්, මැක්ස් වෙබර්,හෙන්රි ගාන්ට්
B. එෆ්.ඩබ්ලිව්. ටේලර්, ෆ්‍රෑන්ක් සහ ලිලියන් ගිල්බර්ත්, හෙන්රි ගාන්ට්
C. එෆ්.ඩබ්ලිව්.ටේලර්, ෆ්‍රෑන්ක් සහ ලිලියන් ගිල්බර්ත්, හෙන්රි ෆැයෝල්
D. එෆ්.ඩබ්ලිව්.ටේලර්, හෙන්රි ෆැයෝල්, මැක්ස් වෙබර්

a. A සහ C b. C පමණි. c. B පමණි. d. D සහ B

02. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් හෙන්රි ෆැයෝල් විස්තර කරන ලද කළමනාකරණ මූලධර්ම (Principles of Management) වැරදි ලෙස දක්වා ඇති ප්‍රකාශ(ය) කුමක් ද?

A. ශ්‍රම විභජනය, අධිකාරිය, විනය, නියෝග දීමේ ඒකීය බව (Unity of Command)
B. ශ්‍රම විභජනය, මෙහෙයවීමේ ඒකීයබව (Unity of Direction) පාරිතෝෂණය (Remuneration) ,මධ්‍යගතකරණය
C. ශ්‍රම විභජනය, අධිකාරීදාමය (Scalar chain), ආර්ථික පිරිමැසුම් (Economies of Scale), මධ්‍යගතකරණය
D. ශ්‍රම විභජනය, අධිකාරිය, විනය, සාධාරණත්වය (Equity)

a. B සහ C b. C පමණි. c. A සහ D d. D පමණි.

විභාග අංකය -

03. ආයතනයක් තුළ "නිවැරදි දෙය සිදු කිරීම" යන්නෙන් අදහස් කරන්නේ,

a. කාර්යක්ෂමතාවය (Efficiency)
b. සඵලදායීතාවය (Effectiveness)
c. ස්වාර්ථ්‍යයතාවය (Efficacy)
d. ඵලදායීතාවය (Productivity)

04. නූතන සංවිධාන බොහෝ විට පාරිසරික විශ්ලේෂණය සිදු කරන්නේ,

a. අනාගත තීරණ සඳහා මඟ පෙන්වීමට ආයතනික වටපිටාව පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා.
b. කොටස් හිමියන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා.
c. සේවකයින් සහ කළමනාකරුවන් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා.
d. ඉහත කිසිවක් නොවේ.

05. නිවැරදි පද සංයෝගය තෝරන්න.

A.	එල්ටන් මායෝ	E.	අවශ්‍යතා න්‍යාය
B.	ඒබ්‍රහම් මැස්ලෝ	F.	හෝතෝන් පරීක්ෂණ
C.	X න්‍යාය සහ Y න්‍යාය	G.	ද්විසාධක න්‍යාය
D.	ෆෙඩ්රික් හර්ස්බර්ග්	H	ඩග්ලස් මැක්ග්‍රෙගර්

a. (A සහ F), (B සහ E), (C සහ G), (D සහ H)
b. (A සහ F), (B සහ E), (C සහ H), (D සහ G)
c. (A සහ E), (B සහ F), (C සහ G), (D සහ H)
d. (A සහ G), (B සහ H), (C සහ E), (D සහ F)

06. පහත උදාහරණ අතුරින් සංවිධානයක ස්ථාවර සැලසුමක් (Standing plan) සඳහා උදාහරණයක් නොවන්නේ කුමක් ද?

a. පුවත්පත් දැන්වීමක් පලකිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය.
b. කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහනක්.
c. කම්හල් බිමේ දී අනුගමනය කළයුතු නීති රෙගුලාසි
d. ආයතනයේ උසස්වීම් ලබාදීමේ ප්‍රතිපත්තිය.

07. ආයතනයකට සෘජු බලපෑමක් ඇති කරන අංශ සහිත ආයතනික පරිසරය වන්නේ,

a. සාමාන්‍ය පරිසරය (General Environment)
b. දේශීය පරිසරය (Local Environment)
c. ඉලක්ක පරිසරය (Task Environment)
d. ජාත්‍යන්තර පරිසරය (International Environment)

08. සංවිධානයකට බලපෑමක් ඇති කළ හැකි ඉලක්ක පරිසර (Task Environment)සාධකයක් සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?

a. ආයතනික සංස්කෘතිය
b. රජයේ රෙගුලාසි
c. තරඟකරුවෝ
d. නායකයන්

විභාග අංකය -

09. නිවැරදි පද සංයෝගය තෝරන්න.

A. විද්‍යාත්මක කළමනාකරණය
B. එන්ට්‍රොපි (Entropy)
C. ලෝරන්ස් සහ ලෝර්ෂ්
D. නිලබලවාදය
E. අවස්ථානුකූල ප්‍රවේශය
F. මෙහෙයුම් පර්යේෂණ කණ්ඩායම් (Operations Research (OR) groups)
G. මැක්ස් වෙබර්
H. පද්ධති ප්‍රවේශය

a. (A සහ F), (B සහ H), (C සහ E), (D සහ G)
b. (A සහ F), (B සහ E), (C සහ H), (D සහ G)
c. (A සහ E), (B සහ F), (C සහ G), (D සහ H)
d. (A සහ G), (B සහ H), (C සහ E), (D සහ F)

10. කාර්යක්ෂමතාවය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

a. එය සම්පත් නාස්තිය හා පිරිවැය අඩු කිරීම පිළිබඳ සංකල්පයයි.
b. එය යෙදවුම් හා නිමවුම් අතර සබඳතාවය අර්ථ දක්වයි.
c. එය ආයතනය විසින් කොතෙක් දුරට සිය අරමුණු, පරමාර්ථ ඉටුකරගෙන ඇති ද යන්න පහදයි.
d. එය "නිවැරදිව කාර්යයන් සිදුකිරීම" පිළිබඳ පහදයි.

11. "ආයතනික අරමුණු ළඟා කරගත හැකි පරිදි අන් අයගේ වැඩ සම්බන්ධීකරණය හා අධීක්ෂණය කරන්නා" හඳුන්වන්නේ,

a. කළමනාකරු
b. අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජික
c. දෙපාර්තමේන්තු ප්‍රධානී
d. ප්‍රධාන විධායක නිලධාරී

12. තීරණ ගැනීම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

a. පෙර සැලසුම් නොකළ තීරණ ආයතනයක ගනු ලබන්නේ ඉහළ කළමනාකරණය විසිනි.
b. කළමනාකරුවන් තීරණ ගත යුත්තේ නිශ්චිත වාතාවරණයක් තුළ පමණි.
c. තීරණයක් යනු පවත්නා විකල්ප අතරින් කරන තෝරා ගැනීමකි.
d. එය සැලසුම්කරණ ක්‍රියාවලියට අඩිතාලම සපයයි.

13. පහත ප්‍රකාශ අතුරින් හෝතෝන් පරීක්ෂණයන් හි අවස්ථාවක්/න් නොවන්නේ කුමක් ද?

A. විදුලි ආලෝකය ආශ්‍රිත පරීක්ෂණය (Illumination Experiment)
B. රිලේ ඇස්ම්බ්ලි ටෙස්ට් රූම් පරීක්ෂණය (Relay Assembly Test Room Study)
C. ඉලක්ක කණ්ඩායම් සම්මුඛ පරීක්ෂණය (Focus Group Interviews)
D. බැන්ක් වයරින් ඔබ්සර්වේෂන් රූම් පරීක්ෂණය (Bank Wiring Observation Room Study)

a. A සහ C
b. C පමණි.
c. C සහ B
d. D සහ C

විභාග අංකය -

14. පහත දැක්වෙන දෑ අතරින් සැලසුමක මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

a. අරමුණු b. පුරෝකථන c. අයවැය d. උපකල්පන

15. සංවිධානයක අභ්‍යන්තර සහ බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම මූලික පියවරක් වනුයේ,

a. උපාය මාර්ග සැලසුම් (Tactical plans) සඳහා ය.
b. ක්‍රමෝපාය සැලසුම් (Strategic plans) සඳහා ය.
c. ක්‍රියාකාරී සැලසුම් (Operational plans) සඳහා ය.
d. ස්ථාවර සැලසුම් (Standing plans) සඳහා ය.

16. සංවිධානකරණ ක්‍රියාවලිය අර්ථ දැක්විය හැක්කේ

a. විවිධ වූ ක්‍රියාවන් හඳුනාගෙන කාණ්ඩගත කිරීම ලෙස.
b. අරමුණු ඉටුකර ගැනීම සඳහා ඵලදායී සම්බන්ධතාවයන් ස්ථාපනය කිරීම ලෙස
c. a. හා b. දෙකම
d. ඉහත කිසිවක් නොවේ.

17. පහත ප්‍රකාශ අතුරින්, සැලසුම්කරණය පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

a. දැක්ම (vision) සහ මෙහෙවර (mission) ක්‍රමෝපාය සැලසුම් සඳහා මඟ පෙන්වයි.
b. මැද පෙළ කළමනාකරුවන් තම දෙපාර්තමේන්තු සඳහා ක්‍රමෝපාය සැලසුම් සකස් කරයි.
c. සියලු සැලසුම් වසරකට වැඩි කාලයක් සඳහා සකස් කළ යුතු වේ.
d. මෙහෙයුම් මට්ටමේ සේවකයන් සැලසුම් සකස් කිරීමේ කාර්යයන් හා සම්බන්ධ නොවේ.

18. ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීම සඳහා කළමනාකරුවෙකු වෙත වගකීමට පැවරෙන රැකියාවන් ගණන හඳුන්වන්නේ,

a. උපයෝජන දිගුව (Length of adaptation)
b. සම්බන්ධීකරණ අවකාශය (Space of Coordination)
c. පාලන විතස්තීතිය (Span of Control)
d. රැකියා නිර්මාණය (Job Designing)

19. පහත සඳහන් සාධක වලින් සංවිධානයක බාහිර පරිසරයට <u>බලනොපාන</u> සාධක වන්නේ,

a. මෙහෙවර ප්‍රකාශයන් b. ආර්ථික තත්ත්වයන්
c. රජයේ නියාමනය d. තරහකාරිත්වය

20. විධිමත් සංවිධානයක් සම්බන්ධයෙන් පිළිගත **නොහැකි** ප්‍රකාශය වන්නේ,

a. කළමනාකරණය විසින් සංවිධාන ව්‍යුහය සැලසුම් කරයි.
b. කළමනාකරණය විසින් පාලනය හා නිර්මාණය කිරීම සිදු කරයි.
c. නායකයන් තෝරා ගනු ලබයි.
d. ක්‍රියාපටිපාටි හා නීති උල්ලංඝනය කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.

විභාග අංකය -

21. සෑම සංවිධානයක් ම කටයුතු කරන්නේ සීමිත සම්පත් ප්‍රමාණයක් සමඟ වන බැවින් ඔවුන් නිරන්තරයෙන් ම සම්පත් උපයෝජනය උපරිම වන අයුරින් තම නිෂ්පාදිත/ව්‍යාපාර ඒකක අතර සම්පත් බෙදාහැරීමට උත්සහ කරයි. ඉහත අරමුණ ඉටුකර ගැනීම සඳහා සංවිධානයකට යොදා ගත හැකි සුදුසුම ක්‍රමවේදය පහත ඒවා අතරින් කුමක් ද?

a. සමාකරණ විග්‍රහය (Simulation)
b. ජාල විශ්ලේෂණය (Network Analysis)
c. ඒකජ ප්‍රකමණය (Linear Programming)
d. ඩෙල්ෆි ක්‍රමය (Delphi Method)

22. විධිමත් සංවිධානයක් සම්බන්ධ **නිවැරදි** ප්‍රකාශය වන්නේ,

a. ආයතනික නීතිරීති හා රෙගුලාසි මගින් සංවිධානය මෙහෙය වේ.
b. නායකයන් වන්නේ කළමනාකරුවන් ය.
c. a හා b දෙකම
d. මේ කිසිවක් නොවේ.

23. ආදේශකවලින් තර්ජනයක් ඇති විය හැක්කේ, පහත සඳහන් ඒවායින් කුමක් පැනනඟින විට ද?

a. ආදේශකය වඩා මිල අධික අවස්ථාවක
b. ආදේශකය මිල අඩු අවස්ථාවක
c. ආදේශකය හාවිතා කිරීමට වඩාත් පහසු අවස්ථාවක
d. පිළිතුර b සහ c

24. පැවරීමේ කාර්යයෙහි අංගයක්/අංගයන් වන්නේ

a. අධිකාරිය
b. වගකීම
c. වගකීම හා වගවීම
d. ඉහත සියල්ලම

25. ව්‍යාපාරවල කොරතුරු යුගයෙහි පවතින **අවාසියක්** වන්නේ,

a. ලියවිලි රහිත ව ව්‍යාපාර තොරතුරු හුවමාරු කර ගැනීම.
b. ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික දත්ත උකහා ගැනීමට ව්‍යාපාර ආයතනවලට හැකිවීම.
c. පරිගණක සාක්ෂරතාවය හා යටිතල පහසුකම් ඉහළ යාම.
d. ගෝලීය වෙළඳපොළ අවකාශය පුළුල් වීම.

(ලකුණු 02 x 25 = 50)

2 වන කොටස

දෙවන කොටස සඳහා උපදෙස් -

- දෙවන කොටස රචනාමය ප්‍රශ්න පහ (05) කින් සමන්විත වන අතර සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.
- මෙම කොටසින් **ඕනෑම ප්‍රශ්න හතර (04) ක්** සඳහා පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයීම සඳහා ලබා දී ඇති පොත යොදාගන්න.

---

01. සමාජයක් තුළ සංවිධාන පැවතියයුතු වන්නේ මන්ද යන්නත්, සංවිධානයක් තුළ කළමනාකරණය පැවතීම වැදගත් වන්නේ ඇයි ද යන්නත් පැහැදිලි කරන්න.

02. "වසර ගණනාවක් පුරා පර්යේෂකයන්ගේ දැඩි විවේචනයන් ට භාජනය වුවද සංවිධාන පිළිබඳ අධ්‍යයනය සඳහා හෝතෝන් පරීක්ෂණ ඉතා වැදගත් දායකත්වයක් සපයා තිබේ."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? එයට හේතුව කුමක් ද? හෝතෝන් පරීක්ෂණයන් හි *දායකත්වය* සහ ඒ සඳහා වන *විවේචනයන්* ඉස්මතු කර දක්වමින් ඔබේ පිළිතුර විස්තර කරන්න.

03. "පශ්චාත් වසංගත කාල පරිච්ඡේදය තුළ, ආයතනික වර්ධනය සහ පැවැත්ම සඳහා පාරිසරික සංවේදිකාව ඉතා වැදගත් වේ."

ඉහත සඳහන් කල තත්ත්වය තුළ ආයතනික කාර්ය සාධනය කෙරෙහි බලපාන ප්‍රධාන බලපෑම් තුන (03) හඳුනා ගන්න. සුදුසු උදාහරණ භාවිත කරමින් පැහැදිලි කරන්න.

04. "සැලසුම්කරණය, සංවිධානයක අනෙකුත් සියලු කළමනාකරණ ශ්‍රිතයන් (Functions of Management) සඳහා පදනම සපයයි."

ඉහත ප්‍රකාශය සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

05. එක්තරා කළමනාකරුවෙක් පවසා සිටින්නේ සිය යටත් නිලධරයන් හට පවරන ලද කාර්යයන් හි නිමවුම් වල ශිල්පීය ගුණත්වය පිළිබඳ ඔහුට වගකිව නොහැකි බවයි. මෙම කළමනාකරුගේ අධීක්ෂණ නිලධාරියා ලෙස, අදාල කළමනාකරු හට මේ පිළිබඳ උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 50)

(මුළු ලකුණු 100)

හිමිකම් ඇවිරිණි.